විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No.: විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 02/2022

ඔබේ අංකය / உமது இல. / Your No.: ..........................

දිනය / திகதி / Date: 2022.04.22

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

**<u>විශ්‍රාම වැටුප් ලිපිගොනුව අස්ථානගත වූ විට ගෙවීම් කටයුතු සඳහා තාවකාලික ලිපි ගොනුවක් පිළියෙළ කර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධව මා විසින් නිකුත් කරන ලද 2001.12.20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2001 හි උපදෙස් වලට අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛය මගින් විශ්‍රාම වැටුප් ලිපිගොනුව අස්ථානගත වී ඇති අවස්ථාවක තාවකාලික ලිපිගොනුවක් සකස් කර විශ්‍රාම වැටුප් ගෙවීම අඛණ්ඩව පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දී ඇත. එම උපදෙස් පරිදි මේ වන තුරුත් තාවකාලික ලිපිගොනුවක් හෝ සකස් නොකර විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවෙමින් පවතින බව 2022.02.25 දින පැවති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සමුළුවේ දී දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දැනුම් දෙනු ලැබිණි.

03. ඒ අනුව, දැනට විශ්‍රාම වැටුප් ලිපිගොනු නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවනු ලබන විශ්‍රාමිකයන්ගෙන් මාස 03ක කාල සීමාවක් තුළ දී විශ්‍රාම වැටුප් ගොනුවලට අවශ්‍ය පහත ලේඛන අවසන් වරට සේවය කරන ලද ආයතනය මගින් තහවුරු කර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එකී තොරතුරු විශ්‍රාමිකයන් විසින් අදාළ කාලසීමාව තුළදී ලබා දීමට කටයුතු නොකරන්නේ නම්, ඔවුන් වෙත ගෙවනු ලබන විශ්‍රාම වැටුප නතර කිරීමට සිදුවන බව විශ්‍රාමිකයන් දැනුම්වත් කිරීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව ඉල්ලමි.

a. i. විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය

හෝ

b. i. පත්වීම් ලිපිය

ii. විශ්‍රාම ගැන්වීමේ ලිපිය

iii. චර්යා සටහන

**ඒ.ජගත් ඩී ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. ලේකම්,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
2. විගණකාධිපති - කරු.දැ.ගැ.ස